



## 'සොඳුරු සෙවණැලි' අතරින් මතුවන අපූර්ව සංගීතවේදියා

# නදීක ගුරුගේ

**අසංක ලියනගේ**

සංගීතය නැමැති විෂය පිළිබඳ කතා කිරීමේදී හෝ සිතීමේදී අප සියලු දෙනාම පිළිගත යුතු කරුණක් වනුයේ සංගීත නිර්මාණකරුවා එසේත් නොමැති නම් සංගීතඥයා නොමැතිව සංගීතයක් බිහි නොවන බවයි. මෙසේ බිහිවන සංගීතය පෙරදිග, අපරදිග හා අනෙකුත් වශයෙන් ක්‍රමවේදයන්ට බෙදා විකාශනය වේ. මෙහිදී වැදගත්ම කාරණාව වනුයේ තම හැඟීම් සංගීතයට නතු කිරීමයි. එය කිරීමට සංගීතඥයා සතු නිසග හැකියාවක් අවැසි වේ. මේ ආකාරයට එවැනි සංගීතඥයින් වර්ග කළහොත්, ආසියාවේ මහා සංගීතඥයා වන රබීන්ද්‍රනාත් තාගෝර්, යුරෝපයේ සහ විශ්ව සංගීතයේ විශිෂ්ටයින් වන මෝසාර්ට්, බේතෝවන්, ස්ට්‍රවුස්, හෙයිඩන්, චයිකොවුස්කි වැන්නන් හා ඇමරිකාවේ බර්න්ස්ටයින් නම් කළ හැක. ඉහත කියැවුණ නම් සමඟ සඳහන් කිරීමට හැකි සංගීතඥයින් ලංකාවේ බිහි වුණා නම් ඒ ආචාර්ය ප්‍රේමසිරි කේමදාසයන් පමණි. එයට හේතුව තම හැඟීම නෛසර්ගිකව ප්‍රකාශ කළ එකම එකම සංගීතවේදියා ඔහු වීමයි. මෙහිදී සඳහන් කළ යුතු විශේෂ කරුණක් නම් ලංකාව වැනි පුංචි දූපතක ඉපිද විශ්ව සංගීතය පිළිබඳ හැදෑරීම හා ප්‍රකාශනයන් කිරීමට ඔහු තුළ වූ හැකියාවයි.
ඔහුගෙන් පසුව ලාංකේය සංගීතය කොයිබටද යන කරුණ සොයා බැලුවහොත්, අද ලංකාවේ සිටිනා බහුතරයක් තරුණ සංගීතකරුවෝ පැරණි ගීත නවීකරණය කොට සංගීතඥයන් වීමට මාන බලමින් සිටිති. එහෙත් උඩු ගං බලා පිහිනන්නන් ලෝකයේ නැතුවාම නොවේ. නදීක ගුරුගේ නැමැති තරුණ සංගීතවේදියා මෙහිදී තම භූමිකාව කුමක්ද යන වග මේ වන විටත් ලාංකේය රසිකයන්ට, ප්‍රේක්ෂකයන්ට පෙන්වා දී හමාර බවයි මගේ හැඟීම.

නදීක තම සංගීත දිවියේ මුල් අවදියේ තම සොයුරාගෙන් ලද දැනුමත් සහිතව කේමදාස පදනමට ඇතුළත් වී ඉන්පසුව ස්වනිර්මාණයන් ලංකාවට දායාද කළේය. මෙහිදී ඔහු තුළ ඇති භාෂාවේ සුභාවිතය, ඉතිහාසය සහ දේශපාලනික දැනුම ඉතාමත් වැදගත් සාධකයක් විය. ඔහු තම බහුතරයක් නිර්මාණ ක්‍රමවේදයකින් ස්වායත්තව හැඟීම් මුල් කරගනිමින් එළිදැක්වීමේ විශේෂ හැකියාවකින් හෙබි සංගීතවේදියෙකි. ගායනය හා වාදනය යන මාධ්‍ය දෙකම ඔහු අතික්‍රමණය කර ඇති බව ඔහු ගයන වයන ආකරය දුටුවන් මොනවට දනී.

ඔහුගේ නිර්මාණ අතර උත්ථානය, රෝමියෝ, රත්නාවලී, අබා හා සංබාරා ආදිය සුවිශේෂ ස්ථානයන් හි තැබිය හැක. මෙම නිර්මාණ වලදී ඔහු අන්දීය නළාවන්, චැරැංගෝව සහ අනේකවිද ලංකාවට පිටස්තර සංගීත භාණ්ඩයන් උපයෝගී කර ගනිමින් තම දක්ෂතාවය ලොවට පෙන්වා දුන්නේය. ඒ හා සමානවම තවත් විශේෂිත වූ කාරණාවක් නම් අබා චිත්‍රපටයේ සංගීතය නදීක නිර්මාණය කරණුයේ අපෝහණයක් සහිතවය. සංගීතය 'මෙසේ වූවා විය හැක' යන උපකල්පනයේ සිට තම නිර්මාණය දිගහැරිය බව ඔහු වරක් මා සමග පැවසුවේය.
මීට අමතරව ලංකාව හරහා මාරුතයක් ලෙස හමා යන ඔහුගේ 'Nostal Guitar' කොන්සර්ට්ටුව අද ඉතාමත් ප්‍රචලිත වෙමින් පවතී. එයට හේතුව නම් ඔහු තාරුණ්‍යයේ පමණක් නොව මානවයා හා ඉතිහාසයේ දේශපාලනික හදගැස්ම හඳුනාගත් ප්‍රාකාශකයෙක් වීමයි.



මෙවැනි සංගීතඥයෙකුගේ ඇති වටිනාකම කුමක්ද? එය අප කවුරුත් ඉතාමත් නිවැරදිව අවබෝධ කරගත යුතු කරුණකි. මේ වකවානුවේ මුළු ලෝකයම සංගීතමය අහේනියකට ලක්වී ඇති බව සාවධානව ඒ දෙස බැලුවන් හට පසක් වේ. නමුත් එම අහේනිය කුමක්ද එය කෙසේ ඇති වුණිද එයට පිළියම කුමක්ද යන කාරණාවට පිළිතුරු සෙවීමට සංගීතඥයා උනන්දු විය යුතුය. එසේ කළ හැකි සංගීතඥයෝ ඉතාම අතළොස්සක් ලොව පුරා විසිරී සිටිති. එම කුලකයේ අවයවයක් වන නදීක ගුරුගේ තම නිර්මාණ තුළදී සංගීතය ගීතයට පමණක් සීමා නොකොට, එතැනින් ඔබ්බට විකාශනය වුණු මාතෘකාවවන් සොයා මං පෙත් පීරන්නකු බවට පත් වී ඇත.

අපට නොදැණුනද ඔහුගේ 'Nostal Guitar' කොන්සර්ට්ටුව තුළින් ඔහු අද වන විට ශ්‍රී ලාංකේය නූතන 'අයිකොනයක්' බවට පත්වී ඇත. තරුණයන් ගුයිතාරුවට පෙම් බැඳීම වැඩි වී ඇත. මෙමගින් නිවැරදිව ශිල්පීය ක්‍රම හැදෑරීමේ උනන්දුව බාල පරම්පරාවට ප්‍රේරණය වෙමින් පවතී. එයම සංගීතඥයකු ලොවට කරන්නා වූ මහඟු සේවයකි.

අද රටේ වෙසෙන ජනතාව අවබෝධයකින් තොරව සංගීතය රස විඳින තත්ත්වයකට ඇද වැටී ඇත. එයට හේතුව හතු පිපෙන්නාක් මෙන් බිහිවන්නා වූ රූපවාහිනී හා ගුවන් විදුලි නාළිකාවන් තුළින් ප්‍රමිතියකින් තොරව සංගීතය නිරන්තරව අපයෝජනයට ලක් කිරීමයි. එයට වගකිව යුත්තන් මුනිවත රැකීම අපරාධ කාරයාගේ මවගෙන් පේන බැලීමට යාමක් වැනිය. මෙවැනි අර්බුදකාරී වාතාවරණයක නදීක වැන්නෙකු තම ගුයිතාරුවත් රැගෙන කරන්නා වූ අරගලය ඉතාමත් ප්‍රශංසනීය කාර්යභාරයක් බව මගේ ඒකායන හැඟීමයි. සංගීතවේදියකු සතු භාෂාවේ සුභාවිතයද වැදගත් අංගයකි. නදීක ගුරුගේ නැමැති තරුණයාගේ භාෂා ඌරුව ඉතාමත් අගය කළ යුතු ස්ථානයක පවත්නා බව භාෂාව නිවැරදිව හසුරවන්නා වූ ඕනෑම කෙනෙකුට පෙනේ. ඒ'මගින් තමා විශ්වාස කරන්නා වූ අදහස් උදහස් මෙන්ම තමා නිරතවන්නා වූ කර්තව්‍යය පිළිබඳ ජනතාව මනාව දැනුවත් කිරීමටද හැකියාවක් ඇති බව මගේ හැඟීමයි.

'සංගීතඥයා ජනතාවාදී විය යුතුයි' (සියලුම කලාකරුවන්) යන කියමන ලෝකයේ බිහිවූ සියලු අද්විතීය සංගීතඥයන් ක්‍රියාවෙන් ඔප්පුකොට පෙන්වා ඇත. එහි අදහස ජනතාව ඉල්ලන ඕනෑම පුස්සක් සැපයීම නොව ජනතාවගේ බුද්ධිය, ප්‍රඥාව අවදිකරන නිර්මාණ ජනතාවට අනුකූල වන ලෙස විකාශනය කිරීමයි. නදීක ගුරුගේ ඉහත සඳහන් කළ සියලුම ගුණාංග වලින් හෙබි නිර්භීත අවංක සංගීතවේදියෙකි. එමනිසා තමා නිරත කර්තව්‍යයේ බැරෑරුම් කම් සහ අභියෝගයන් ඔහු පසක් කරගෙන ඇති බව මගේ විශ්වාසයයි. වෙනස්ම ආකාරයේ අනන්‍ය සෞන්දර්යය අත්දැකීමක් ලෙස බුද්ධිමත් රසික ප්‍රජාවකට අමතන්නට නියමිත 'සොඳුරු සෙවණැලි - 2016' මියැසි චාරිකාව තුළින් ඔබටත් මේ සොඳුරු තරුණ නිර්මාණකරුවා මුණගැසීමට අවස්ථාව උදාවී ඇත. ඔහුගේ ප්‍රථම ඕස්ට්‍රේලියානු සම්ප්‍රාප්තිය මාර්තු මස 20 වන ඉරුදින, මෙල්බර්න් පුරවරයේ හැම්ප්ටන් පාර්ක් හී රිවර්ගම් පර්ෆෝර්මින්ග් ආර්ට් සෙන්ටර් හීදී ඔබට අත්විඳිය හැක. හදවතටම පමණක් නොව, ඔබගේ බුද්ධියටත් අමතන වෙනස්ම මුහුණුවරක් ගත් මේ සෞන්දර්යාත්මක අත්දැකීම විඳ ගන්න එන ලෙස අපි ඔබට ආදරයෙන් ඇරියුම් කරමු!